## ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාව - වීථිවාර
## ‘අනන්තර ප්‍රත්‍යය සහ නත්ථි ප්‍රත්‍යය’
## 06.02.2020

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥසම්මා සම්බුදුපියාණන් වහන්සේට දුක්ඛ සමුදය නිරෝධ මාර්ග කියන චතුරාර්ය සත්‍යය ධර්මයන් පරෝපදේශ රහිතව ස්වකීය ස්වයම්භූඥානයෙන්ම විසිතුරුව අවබෝධකොට සංසාර දුකෙන් කෙළවර වී අසංඛත ධාතු සංඛාත නිර්වාණ ධාතුව නුවණින් ස්පර්ශකොට වදාළා වූ අනන්ත අපරිමාණ ගුණ ඇති සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ තථාගතයන් වහන්සේ අවබෝධකොටගෙන දේශනාකොට වදාළා වූ අන්නන්ත සත්වයන් සංසාර දුකින් එතෙර කරවීමට නෛර්යාණික ධර්ම ශක්තිය අන්තර්ගත වූ ශ්‍රී සද්ධර්ම රත්නයට මම සිරසින් වැඳනමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ දහම් අවවාදයේ පිහිටා ධර්මයෙන් පෝෂණය කරගෙන සන්තාන වඩාගෙන සංසාර දුකින් මිදී නිවනින් සැනසී ගියා වූ රහතන්වහන්සේලා ආර්යන් වහන්සේලා අන්තර්ගත සුපටිපන්න ආදී ගුණයන්ගෙන් සමලංකෘත මහා සංඝරත්නයට මම නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ අනන්ත අප්‍රමාණ ගුණ බලයෙන් ධර්ම රත්නයේ අනන්ත ගුණ බලයෙන් සංඝ රත්නයේ අනන්ත ගුණ බලයෙන් තුනුරුවන් ගුණ මෙනෙහි කිරීමේ වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වතුන් මේ අවස්ථාව දක්වාම සිදු කරගත් කුසල ධර්මයන්ගේ ආනුභාවයෙන් අදත් මේ පින්වත් සියලු දෙනාටම අපි කියලා දෙන්න බලාපොරොත්තුවන ධර්ම කාණ්ඩය ඉතා හොඳින් වටහා ගන්න නුවණ පහළ වේවා! සිහිය අවධි වේවා! ක්ලේශ ධර්මයන්ගෙන් බාධයක් නොම වේවා! සිත සමාධි ගතකරගෙන නීවරණ ධර්මයන්ගෙන් පිඩා විඳින්නේ නැතුව නුවණ මෙහෙයවා මනසිකාරය මෙහෙයවා ධර්ම කරුණු ටික තේරුම් අරගෙන එය මාර්ගයක් කොටගෙන නිවන් ගමන සුවසේ යාගන්න ලැබේවා කියලා අපි මෛත්‍රියෙන් ආශිර්වාද කරනවා, ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් මේ පින්වතුන්ට අදට සාකච්ඡා වශයෙන් කියලා දෙන්න හිතාගෙන ඉන්න ධර්ම කාණ්ඩය මතක් කරනවා.

අපි සූවිසි පට්ඨාන ධර්ම කාරණාවන් දිගින් දිගටම දැන් අවුරුදු දෙකකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් මේ ධර්ම සාකච්ඡාව කරගෙන ආවා. මේ පට්ඨාන කියන කථාව බොහෝම සංකීර්ණ ලෙහෙසියෙන් පහසුවෙන් සමාන්‍යයෙන් ජීවන කථාවක් චරිත කථාවක් තේරුම් ගන්නවා වගේ තෙරුම් ගන්න පුළුවන් එකක් නොවෙයි. ඒකට හේතුව, සත්වයෝ මනුස්සයෝ පුද්ගල අදහස් සත්ව අදහස් සිතේ දරාගෙන ඉන්න පිරිසක්. පුද්ගල හැඟීම සත්ව හැඟීම බලවත් ලෙස තිබෙනවා. ඒක නිසා අපි කතන්දරයක් කියනකොට ඒක රහට හිතට හසුවෙනවා. ඒක රහට හිතට දැනෙනවා. ඒක රහට හිතට ග්‍රහණය කරගන්න පුළුවන්. හේතුව, ඒ පුද්ගල ආමන්ත්‍රණය කරන හැඟීම තදබල විදියට තිබෙන නිසා. ඒක නිසා ලෝකයේ චරිතකථාවන් නවකථාවන් ඒවගේම දේශනාවන් තේරුම් ගන්න පුළුවන්. නමුත් මේ අභිධර්ම විස්තරයට එනකොට ඒ අභිධර්ම විග්‍රහයේ තිබෙන්නේ පුද්ගල ආමන්ත්‍රණ නැති - සත්ව ආමන්ත්‍රණ නැති - කෙනෙක් කියලා ආමන්ත්‍රණයක් කරන්නේ නැති - අමුතුම විදියේ ධර්ම කාණ්ඩ පමණක් කථා කරන - ධර්ම විස්තර පමණක් කියන එකක්. සත්වයෙක් පුද්ගලයෙක් හැටියට කථා

කරපු දේවල් වලම - ඒ ස්කන්ධ ගොඩේම තිබෙන රාශි භූත වෙලා ක්‍රියාත්මක වෙන ධර්ම කොටස් විතරයි මේකේ තිබෙන්නේ. ඒක නිසා මේ වැඩේ, මේ පට්ඨානය ඊළඟට අභිධර්ම කරුණු තේරුම් ගැනීමට හරි වෙහෙසක්. හොඳ ඥානාන්විත කැප කිරීමක් මේකට යොදන්න ඕනෑ. එතකොට තමයි මේක තේරෙන්නේ. අපි මේ උත්සාහ දරන්නෙත් බණ භාවනා ආදී කටයුතු සිද්ධ කරලා උනත් උත්සාහ කරන්නේ සත්ව හැඟීම පුද්ගල හැඟීම ජීවී හැඟීම අයින් කරන්න. ඒක අයින් කරොත් තමයි නිර්වාණ ධාතුව ස්පර්ෂ කරන්න පුළුවන් වෙන්නේ. අභිධර්ම විග්‍රහයේ තිබෙන ඉතාමත්ම විසිතුරු ශක්තිය තමයි මුලින්ම සත්ව පුද්ගල කථාව අයින් කරලා ඒ සත්ව පුද්ගල කියන තැන තිබෙන්නේ මෙන්න මේ ටිකයි කියලා ධර්ම ටික වෙන්කරලා බෙදන නිසා මේක හරි පහසුවක් වෙනවා නිවන් අවබෝධ කරගන්න මාර්ගයට යාගන්න සහ ඒ මාර්ගයේ ගමන් කරන්න.

සම්මුති ආමන්ත්‍රණය සහ පරමාර්ථ ආමන්ත්‍රණය යනුවෙන් ආමන්ත්‍රණ විදි දෙකක් තිබෙන බව අපි තේරුම් ගන්න ඕනෑ. සම්මුති ආමන්ත්‍රණයේ තමයි ලෝකය සම්බන්ධයෙන් කථා කරන්නේ, පුද්ගල දේව මනුස්ස කථාව තිබෙන්නේ. පරමාර්ථ ධර්ම ආමන්ත්‍රණයේ ඒක සම්පූර්ණ ගලවලා දාලා නාම ධර්ම කියලා ටිකක් තිබෙනවාය - රූප ධර්ම තිබෙනවාය - චෛතසික ධර්ම තිබෙනවාය - නිර්වාණ ධාතුව කියලා ධර්මතාවයක් තිබෙනවා කියලා ඒවා වෙන් වෙන්ව ගලවලා පෙන්වනවා. මේක නිසා පුද්ගල කථාවක් මෙතැනට ඉදිරිපත් වෙන්නේ නැති නිසා සත්ව කථාවක් නැති ධර්ම ගොණු තිබෙන නිසා අපේ අහගෙන ඉන්න පින්වතුන්ට මේවට සම්බන්ධ වෙන පින්වතුන්ට විශේෂයෙන්ම ඔය ධර්ම මොනවාද කියලා තේරුම් ගන්න හිතන්න මනසිකාරමය ඥානාන්විත කුසල වීර්යක් යොදන්න වෙනවා. ඒක තමයි අපි පසුගිය කාලයේ දිගටම කරගෙන කරගෙන ආවේ.

ගිය සතියේ අපි අවසන් කළා අතහැරී ගිය විප්පයුත්ත ප්‍රත්‍යය පිළිබඳව. ඊට කලින් මම කිව්වා නත්ථි ප්‍රත්‍යය ගැන අහපු ප්‍රශ්නයකට සාකච්ඡා වශයෙන් කරුණු ටිකක් ඉදිරිපත් කරනවා කියලා. මම ඒක තමයි අද මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. **අනන්තර ප්‍රත්‍යයයි - නත්ථි ප්‍රත්‍යය** යන දෙක එක සමාන වෙන්නේ නෑ, නමුත් පුංචි ළඟ ගතියක් ඕකේ තිබෙනවා. ඒ ධර්මතා දෙක ක්‍රියාත්මක වීමේදී ළඟ ගතියක් තිබෙනවා. ඒක නිසා මේ පින්වතුන්ට ඒකෙ කොටසක් මතක් කරනවා. මේක තේරුම් ගන්න නම් නත්ථි ප්‍රත්‍යයයි අනන්තර ප්‍රත්‍යයයි දෙක පිළිබඳව මේ වෙලාවට අපේ මතකය අවදි කරගන්න ඕනෑ. අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ අපි මීට ඉස්සෙල්ලා කථා කරපු ප්‍රත්‍යය ධර්මයක්. ඒ අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ, දැන් බලන්න එක සිතක් පහළ වෙලා ඒක නැතිවෙලා යනවා. ඒක නැතිවෙලා යනකොටම තව සිතක් පහළ වෙනවා. ඒක නැතිවෙලා යනකොට තව සිතක් පහළ වෙනවා. ඔය වගේ ළඟින් ළඟින් හේත්තු වේගෙන හේත්තු වේගෙන අතරක් නැතුව සිත් පහළ වීම දිගටම සිද්ධ වෙන ක්‍රියාවලියක් තිබෙන්නේ. ඒකෙ අතරක් නෑ, දිගට සිද්ධ වෙනවා. දිගටම සිත් පහළ වීමේ ක්‍රියාව සිද්ධ උනත් එක වෙලාවකට තිබෙන්නේ එක සිතක් පමණයි. ඒ සිත ඇතිවෙලා මොකක් හරි වැඩක් කරලා නැතිවෙලා ගියාට පස්සේ තමයි අනිත් සිතට පහළ වීමට අවස්ථාව සැලසෙන්නේ. ඔය ධර්ම ස්වභාවය තමයි තිබෙන්නේ. එතකොට මේවා නාම ධර්ම, ඖලාරික රූප ධර්ම එහෙම නොවෙයි. මේවා පුදුම විදියට රංචු ගැහිලා හැදෙන නාම ධර්ම සමූහ. ඉස්සරවෙලා පහළ වෙච්ච සිත නැති උනහම පස්සේ සිතක් පහළ වෙනවා. අපි කිව්වා ඒක තමයි ධර්ම ස්වභාවය. ඒ ඉස්සරවෙලා ඇති වෙචච සිතේ තිබෙනවා ස්වභාවයක්, ශක්තියක් අමුතු ගැම්මක් ඒක නැතිවෙලා යන්නේ ඊළඟ සිතක් පහළ කිරීමට අමුතු දෙයක් වීසි කරගෙන වගේ. අන්න ඒවගේ ස්වභාවයක් තිබෙනවා. සිත නැතිවෙලා යනවා, ඒ නිසා තමයි ඊළඟ සිත පහළ වෙන්නේ.

අපි හිතමු මෙහෙම, අපිට මේ වෙලාවේ මේ මොහොතේ යම්කිසි සිතක් තිබෙනවා. ඒ සිත පහළ උනේ මීට ඉස්සෙල්ලා පහළ වෙච්ච සිතේ යම්කිසි උලුප්පවලා දෙන ඒවගේම අවධි කරවලා දෙනවා වගේ ගතියක් නිසා. අර ක්‍රීඩාවක් තිබෙනවා, ඒකට relay දුවනවා කියලා කියන්නේ. බැටන් එක එක්කෙනෙක් අරගෙන ගිහිල්ලා තව එක්කෙනෙකුට දෙනවා. එයා දුවගෙන ගිහිල්ලා තව කෙනෙකුට

දෙනවා. ඔය වගේ relay දුවන අය වෙනස් වෙනවා. ඉස්සෙල්ලා එක්කෙනා බැටින් එක අනිත් එක්කෙනාට දුන්නොත් තමයි දෙවෙනි එක්කෙනාට දුවන්න පුළුවන් කම තිබෙන්නේ. අන්න ඒවගේ මේ වෙලාවේ අපිට පහළ වෙන මේ සිත පහළ වෙලා තිබෙන්නේ ඉස්සෙල්ලා සිතකින් ලබා දීපු ගැම්මක් නිසයි. ඉස්සෙල්ලා සිත කියන්නේ නෑ මේ සිත පහළ වෙන්න ඕනෑ කියලා, එහෙම තීරණයක් දෙන කථාව නොවෙයි මේ කියන්නේ. එහෙම උනොත් වර්තමාන සිතේ නිරූපකයා නැත්නම් වර්තමාන සිත හදපු එක්කෙනා පරණ සිත වෙනවා. නමුත් එහෙම එකක් නොවෙයි, අමුතු ගැම්මක් විතරක් ලබා දෙනවා. ඒක නිසා මේ වෙලාවේ පහළ වෙච්ච සිත පහළ වෙන්නේ ඊට ඉස්සර වෙලා තිබුණ හිත නිසා. ඒ හිත පහළවෙලා තිබෙන්නේ ඊට ඉස්සර වෙලා හිත පහළ වෙච්ච නිසා. ඔය වගේ අතරක් නැතුව කලින් පහළ වෙච්ච සිත ආධාර කරගෙන දෙවෙනි සිත පහළ වීමේ ක්‍රියා වලිය දිගටම සිද්ධ වෙන නිසා ඒකට අනන්තර ප්‍රත්‍යය කියලා කියනවා. අනන්තර ප්‍රත්‍යය ගතිය තිබෙන්නේ කලින් සිතටයි, දෙවෙනි සිතට නොවෙයි. දෙවෙනි සිත ප්‍රත්‍යය උප්පන්න සිතයි. දෙවෙනි සිත ඉස්සෙල්ලා සිතක් පහළ වෙච්ච හින්දා පහළ වෙන සිත. මේක දිගටම තිබෙනවා. යම්කිසි දවසක සසරේ කොහේ හරි සිත් පහළ වීමක් සිද්ධ උනානම් එතැන ඉඳලම අනන්තර ප්‍රත්‍යය ශක්තිය දිගටම ගිහිල්ලා තිබෙනවා. මේ අන්නතර ප්‍රත්‍යය ශක්තිය නැති එක සිතක් තිබෙනවා. ඒ කියන්නේ එතැනින් පස්සේ සිත් පහළ වෙන්නේ නෑ. ඒ තමයි අනන්තර ශක්තියක් නැති අනන්තර ප්‍රත්‍යය ගුණයක් නැති රහතන් වහන්සේ නමක් පිරිනිවන්පාන අවස්ථාවේදී පහළවෙන චුති සිත. මේ සිතට අනන්තර ප්‍රත්‍යය ශක්තිය නෑ. ඒක නිසා රහතන් වහන්සේගේ චුති සිතෙන් පස්සේ සිත් පහළ වීමක් නෑ. ආන්න එතැනට කියනවා නිවීගියා කියලා. අනන්තර ප්‍රත්‍යය තිබුණා නම් නැවතත් සිත් පහළ වෙන්න ඕනෑ.

සාමාන්‍ය මනුස්සයෙක් නැත්නම් දෙවියෙක් එහෙම නැත්නම් බ්‍රහ්මයෙක් හෝ යම්කිසි සංසාරයේ ඉන්න කෙනෙක්, රහත් භාවයට පත් වෙච්ච නැති කෙනෙක් චුත උනොත් ඒ චුති සිතේ අමුතු ගතියක් තිබෙනවා. චුත වීමේ තිබෙනවා ස්වභාව කීපයක්. 'චුතවීමේ' තිබෙන්නේ අදාළ භවය අයින් කිරීමයි. අදාළ භවය කෙළවර කිරීමයි. එහෙම උනාට ඒ සිත දිගට වැඩ කරපු මනුස්ස ජීවිතය හරි, දිව්‍ය ජීවිතය හරි බ්‍රහ්ම ජීවිතය හරි තිරිසන් ජීවිතය හරි මොකක් හරි කාලයකට රැඳී තිබ්ච්ච ඒ භවය අවසන් කිරීමේ කටයුත්ත චුති සිතෙන් සිද්ධ උනාට අනන්තර ප්‍රත්‍යය කියනඑක ඒකෙ තිබෙනවා. අනන්තර ප්‍රත්‍යය ශක්තිය තිබෙන හින්දා ඒකෙන් කරන්නේ චුතිය වෙනකොටම ප්‍රතිසන්ධිය කියන එක හදලා දෙනවා. ඒක නිසා මේ සමාන්‍ය මනුස්සයෙකුගේ දෙවියකුගේ තිරිසන් සත්වයෙකුගේ චුති සිත අනන්තර ප්‍රත්‍යයෙන් යුක්තයි. ඒක නිසයි ප්‍රතිසන්ධිය. ප්‍රතිසන්ධියෙන් පස්සේ ඇතිවෙනවා භවාංග සිත්. ප්‍රතිසන්ධි සිතත් අනන්තර ප්‍රත්‍යයෙන් යුක්තයි. භවාංග සිතුත් අනන්තර ප්‍රත්‍යයෙන් සමන්නාගතයි. ඒක නිසා මේ හැම සිතක්ම පහළ වෙලා නැතිවෙනකොට අදාළ සිතක් මතු කරන්න ගොනු කරන්න හැදෙන්න අමුතු ගතියක් ඇතිකරගෙන යන ස්වභාවයක් ඕකේ තිබෙනවා. මේ තමයි අනන්තර ගුණය - අනන්තර ශක්තිය - අනන්තර ප්‍රත්‍යය. මේකේ ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න ධර්ම ඔක්කොම නත්ථි ප්‍රත්‍යයට සමානයි.

මේකේ අනිත් කාරණය අපි තේරුම් ගන්න ඕනෑ මෙහෙම. දෙවෙනුවට හිතක් පහළ කරන්න පරම්පරානුයාත නෑදෑ කමක්, එහෙම නැත්නම් හයියක් දෙන ගතිය පළවෙනි සිතට තිබුණත් දෙවෙනුවට හිතක් පහළ කරන්න ඒ පළවෙනි සිත එතැනින් අයින් වෙන්න ඕනෑ. ඒ සිතේ තිබෙන දෙවෙනි එකට උදව් කිරීම, ප්‍රත්‍යය ශක්තිය කියන එක වෙන එකක්, ඒක ලබා දීලා ඒ පළවෙනි සිත එතැනින් අයින් වෙන්න ඕනෑ. ඒක අයින් උනාට පස්සේ තමයි දෙවෙනි සිත එතැන පහළ වෙන්නේ. **අන්න ඒ පළවෙනි සිතෙන් දෙවෙනි සිතට දෙන ශක්තියට කියනවා අනන්තර ප්‍රත්‍යය ශක්තිය කියලා. අනන්තර ප්‍රත්‍යය දීපු ඒ සිත එතැනින් අයින් වෙලා තුරන් වෙලා හිස් තැනක් හදලා දෙනවට කියනවා නත්ථි ප්‍රත්‍යය කියලා.**

දැන් බලන්න ඒකෙ තිබෙන අමුතු ගතිය. දෙවෙනි සිතට යම්කිසි ශක්තියක් ලබා දෙනවා. නමුත් දෙවෙනි සිත පහළ වෙන්න හිස් තැනකුත් ඇති කරලා යනවා. හිස් තැන ඇති කිරීම **නත්ථි ප්‍රත්‍යයයි.** දෙවෙනි එකක් මතුකිරීමට පෙළ ගස්වා දීම **අනන්තර ප්‍රත්‍යයයි.** හරිම ළඟ දෙයක්. අපි හිතමු මෙහෙම - කෝප්පයක් තිබෙනවා, ඒකෙ වතුර තිබෙනවා. අපිට තේ බොන්න ඕනෑ. කෝප්පයේ වතුර තිබෙන තාක් කල් අපිට කෝප්පයෙන් තේ බොන්න බෑ. දැන් අපි වතුර එක අයින් කරනවා. එතකොට කෝප්පය හිස් වෙනවා. ඒ හිස් ගතිය නත්ථි ප්‍රත්‍යයයි. ඒවගේම ඒ කෝප්පයේ ප්‍රමාණයට තව එකක් දාන්න පුළුවන් ගතිය කියලා ගත්තොත් එතැන තිබෙනවා අනන්තර ප්‍රත්‍යය. ඔන්න ඔය විදියට තමයි අනන්තර ප්‍රත්‍යයයි යයි නත්ථි ප්‍රත්‍යයයි දෙකේ වෙනස අපි තේරුම් ගන්න ඕනෑ වෙන්නේ. පොඩි නූලකින් වගේ එහෙට මෙහෙට වෙන්නේ. පුංචි කෙන්දකින් වගේ එහෙට මෙහෙට වෙන්නේ.

මේ ධර්ම හරි බලවත්. හරිම බලවත් අකුණක් ගැහුවම අපිට කරුණු තුනක් හිතන්න පුළුවන් ප්‍රධාන වශයෙන්. කරුණු දෙකක් පැහැදිලියි එකක් අපැහැදිලියි. ඒ තමයි අකුණක් ගහනකොට එළියක් වැටෙනවා, ඒක පැහැදිලියි. අකුණක් ගහනකොට සද්දයක් හැදෙනවා. එකත් පැහැදිලියි. එළියයි ශබ්දෙයි දෙක අපි අත් විඳිනවා. අපි අත් විඳින්නේ නැති දේ තමයි හොයන්න අමාරු දේ තමයි ඒ අකුණ ඇතුලේ යම්කිසි වස්තුවක් විනාස කරන්න පුළුවන් ශක්තිය හයිය කොච්චර තිබෙනවාද කියලා. අපිට ඒක මනින්න බෑ, ඒක දැනගන්න බෑ, කිරන්න බෑ, measure කරන්න බෑ. එහෙම ගතියක් ඒකෙ තිබෙනවා. එතකොට ඒ ශක්තිය කියන එක තමයි අපිට හඳුනා ගන්න බැරි දේ. ශබ්දයයි එළියයි තමයි ග්‍රහණය කරගන්න ටිකක් පහසු දේ. හැබැයි අකුණක එළියෙනුයි අකුණක ශබ්දයෙනුයි තේරුම් ගන්න පුළුවන් ඒ අකුණේ තිබෙන්නා වූ බලය මෙන්න මේ වගේ වෙන්න ඇතෙයි කියලා. මේ වගේ බලයක් ඇතෙයි කියලා අපිට හිතෙන් දැනුමක් ඇතිකරගන්න පුළුවන්. මේ නාම ධර්ම වල තිබෙන අන්තර්ගත ශක්තිය අපිට එහෙම measure කරන්න බෑ. ධර්මයේ කියලා තිබෙන්නා වූ ටිකෙන් අපි තේරුම් ගන්නවා. හිතක් පහළ වෙනකොට ඒ සිත තනි හුදකලා වෙච්ච චිත්ත මාත්‍රයක් නොවෙයි. ඒක තවත් අනුයාත චිත්තගති හෙවත් චෛතසික ධර්මයන්ගේ උදව් උපකාර ලබාගෙන හයිය ගැහිච්ච එකක්. සිත නිකම්ම නිකම් හුදකලා වෙච්ච නාම ධර්මයක් නොවෙයි. තවත් චෛතසික ධර්ම වල හයිය ලබාගෙන බලයක් කිට්ටුකරගෙන හයිය ගස්ස ගත්ත චෛතසික ටිකක් ආධාර කරගෙන පොදියට පහළ වෙන ධර්මයක්.

ඔය අනන්තර ප්‍රත්‍යය ශක්තිය කියලා කියන එක දෙවෙනි සිතට පහළ වෙන්න ශක්තියක් උලුප්පවලා 'මම යනවා, ඔබ පහළ වේවා' කියලා කියන්න වගේ යම්කිසි හෙවනැල්ලක් දීගෙන යන්න පුළුවන් ගතියක් තිබෙන ඒ පළවෙනි සිත නිකම් හුදකලා චිත්ත මාත්‍රයක් නොවෙයි. ඒ සිත සර්ව චිත්ත සාධාරණ චෛතසික ධර්මයන්ගෙන් හැඩ ගැන්විලා වැඩ කරන්න පුළුවන් විදියට බල ගැන්විලා හයිය තිබෙන එකක්. මේ කථාව කියනකොට ඇත්තටම මෙහෙම එකක් තිබෙනවාද කියලා මේ පින්වතුන්ට හිතෙන්න පුළුවන්. පස්සේ අවස්ථාවකදී අහන කෙනෙකුට සිතක් පහළ වෙන්න පුළුවන්. අපි තේරුම් ගන්න ඕනෑ, ඔය චිත්ත ගතියක් චිත්ත ශක්තියක් measure කරගන්න පුළුවන් හයියක් තිබෙන නුවණක් ගැම්මට අහුවෙච්ච පිරිසක් නොවෙයි අපි කියලා. මේක අපි තේරුම් ගන්න ඕනෑ. අපිට නොවැටහෙන දේවල් ඔක්කෝම නැති දේවල් නොවෙයි. අපිට නොවැටහෙන්නේ වටහාගන්න පුළුවන් හයිය තිබෙන ඥානය ප්‍රඥාව නුවණ ඒ ප්‍රමාණයට නැති හින්දයි. අපි අවංකවම නිහතමානීව ඔය කාරණය බාර ගන්න ඕනෑ.

අපි කියනවා තථාගත බුදුරජාණන් වහන්සේට මේ දේශනා කරන මේ ධර්මය අතට පත් නෙල්ලිගෙඩිය වගේ හොඳට පැහැදිලිව විසිතුරුව පේනවා කියලා. මට හිතෙනවා ඇයි ඔය නෙල්ලිගෙඩියක් දැම්මේ කියලා මේ වැටහීම කියන්න. මේ පින්වතුන් ලංකාවට ගියහම අත්හදා බලන්න පුළුවන් හොඳට මෝරපු නෙල්ලිගෙඩියක් අතට ගත්තම කොළ පාට මැණිකක් වගෙයි. ඒකෙ තිබෙනවා සුදුපාට කෙඳි ගිය ගතියක්, නාරටි නාරටි ගිය ගතියක්. නෙල්ලිගෙඩිය ගහේ තිබෙනකොට පේන්නේ කොළ පාට මීදී

ගෙඩියක් වගේ. අතට ගත්තහම ඒකෙ ඇතුලත පේන ගතියක් තිබෙනවා. ඊළඟට තිබෙනවා ඉරි ඉරි ගිය නාරටි නාරටි වෙච්ච - ලොකු ඉරි - පොඩි ඉරි - බෙදී ගිය ඉරි - ඒවගේම නෙල්ලිගෙඩියේ තිබෙනවා දොඩම් ගෙඩියේ වගේ කොටස් බෙරිච්ච ගතියක්. ඔය ඔක්කොම නෙල්ලිගෙඩිය අතට ගත්තට පස්සේ තේරෙනවා. ඒ ඔක්කොම ටික තිබෙන්නේ එක තැනක. ඉරි ගැහිච්ච එක - රවුම් ගැහිච්ච එක - පොකුරු ගැහිච්ච එක ඔක්කොම තිබෙන්නේ එක තැන. ලොව්තුරා බුදුරජාණන්වහන්සේටත් චිත්ත ධර්මයක් ගත්තහම ඔය නෙල්ලිගෙඩිය වගෙයි. ශ්‍රද්ධාව වීර්ය ඒකග්ගතාවය ඡන්දය විතක්කය ඇතුළු චෛතසික ඔක්කොම තිබෙන විදිය සහ ඒවා ක්‍රියාත්මක වෙන විදිය හොඳට තේරෙනවා දැනෙනවා පේනවා. ඒක නිසා නෙල්ලිගෙඩියක් අතට ගත්තාසේ තථාගතයන් වහන්සේට මේක පේනවා. සිතක් කියලා කියන්නේ චෛතසික ධර්මයන්ගෙන් හැඩ ගැන්විච්ච බලගැන්විච්ච තෙද ගැන්විච්ච ධර්මයක්. ඒක නිසා ඉස්සර වෙලා නැති වී යනහිත දෙවෙනියට ඒවාගේම අඩුවෙන් හරි වැඩියෙන් හරි අදාළ චෛතසික ප්‍රමාණයක් ඇතුව හිතක් උපදින්න ගැම්ම බලය දීගෙන, ඊළඟට සිතට මග පෙන්නාගෙන මේ වැඩේ කරනවා. මේ තමයි අනන්තර ප්‍රත්‍යයේ තිබෙන ස්වභාවය. නමුත් එහෙම හයිය තිබෙන පොකුරක් උනත් ඒකත් නැතිවෙලා යනවා. අන්න එහෙම හිස්වෙලා ගිය තැන තමයි අර දෙවෙනි සිත තවත් බලයක් හදාගෙන මතුවෙන්නේ.

ඉතින් අපි ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - ජීවිතින්ද්‍රිය - මනසිකාර - විතක්ක - විචාර - අධිමොක්ඛ - විරිය - පීති - ඡන්ද කියලා මේ විදියට අපි නාමික වශයෙන් කියනවා. නමුත් මේ ධර්ම දන්නේ නෑ ඒවාට ඔහොම නම් කථා කරනවා කියලා. ඒවා අමුතුම විදියේ එකට වැඩ කරන තනි ධර්ම. විදුලිය දන්නේ නෑ විදුලියට ඉංග්‍රීසියෙන් power කියලා කියනවා current එක කියලා කියනවා සිංහලෙන් විදුලිය කියනවා කියලා. අපි කථා කිරීම සඳහා ඒ විදියට නම් තියාගෙන තිබුණත් ඒ බලය අමුතු විදියට තිබෙනවා.

අපි හිතමු අපි විදුලිය කියන වචනය පාවිච්චි කරන්නෙත් නැති උනත් current කියන වචනය පාවිච්චි නැති උනත් power කියලා පාවිච්චි කරන්නෙත් නැති උනත් electricity කියන ධර්ම ස්වභාවය නැති වෙන්නේ නෑ. ඒවගේ මේ නාම ධර්ම වල ගතිටික එකතු වෙලා ක්‍රියාත්මක වෙනවා. අපි මෙන්න මේ වාගේ පුද්ගල හැඟීම් නැති පුද්ගල ඇඳිලි නැති විස්තරයක් තමයි අභිධර්ම කථනයෙන් ඔය විදියට දිගට කරගෙන ගියේ.

මේ කථාව තේරුම් ගන්නත් අනන්තර ප්‍රත්‍යයයි නත්ථි ප්‍රත්‍යයයි තේරුම් ගැනීමටත් මහෝපකාරී වෙන පාඩමක් තමයි චිත්ත වීථි පිළිබඳව දැනගෙන තිබීම. ඒ චිත්ත වීථි ගැන හොඳටම දැන ගත්තහම ඒවා යෙදෙන විදිය දැන ගත්තහම තමයි කෙනෙකුට මේකේ හැඩය - රසය - ධර්මය පැහැදිලිව තේරුම් ගන්න පුළුවන් හැකියාව තිබෙන්නේ. කෙනෙක් අහන්න පුළුවන් මොන සූත්‍රයේද චිත්ත වීථි තිබෙන්නේ කියලා. සූත්‍රය කියෙව්වේ නැතත් ඔය වගේ ප්‍රශ්න අහන්න මිනිස්සු ඉන්නවා. ඇත්තට මේ චිත්ත වීථි ස්වභාවය දේශනා කරලා තිබෙන තැන් තිබෙනවා ගොඩක්. ඒක චිත්ත වීථි කථාවට පෙළ ගස්සලා තිබෙන්නේ අපිට දහම් දැනුම ලබා දෙන්න ඕනෑකමක් තිබුණ කරුණාවන්ත ස්වාමීන්වහන්සේලා.

සිතක් පහළ වෙන විදිය - සිතක තිබෙන ධර්ම ස්වභාවය ඊළඟට පංචද්වාරාවජ්ජන සිත් - මනෝ ද්වාරාවජ්ජන සිත් - ජවන් සිත් ඔක්කෝම තිබෙනවා අභිධර්ම ප්‍රධාන පොත්වල. ධම්මසංඝණියේ විභංග ප්‍රකරණයේ වගේ පොත්වල තිබෙනවා. ඒවා කියෙව්වහම ඥානය බුද්ධිය ප්‍රඥාව සිහිය කල්පනාව හොඳට තිබෙන ස්වාමීන්වහන්සේලාට ශ්‍රද්ධාවන්ත අයට ඒක කියනකොට කිසිම ප්‍රශ්නයක් නැතුව ඒක වෙන්නේ මෙහෙමයි කියලා ඔය කථාව හොඳට තේරෙනවා. හැබැයි ඔක්කොටම ඕක තේරෙන්නේ නෑ. ඒක නිසා ඒ වැටහෙන්නේ නැති අයට තේරෙන්නේ නැති අයට මේක මෙහෙමයි වෙන්නේ කියලා ඒ ටික අර පොතෙන් ගලවලා ඒක සිද්ධ වෙනහැටි පිංතූර ගතකරමින් විදහා දක්වලා කියලා දෙන්න ඕනෑ. ඔය වැඩේ තමයි ඔය චිත්ත වීථි වලින් කරලා තිබෙන්නේ. එහෙම නැතුව චිත්ත

වීථි කියලා වෙන කොහෙන් හරි planet එකකින් ගෙනාපු වචන නොවෙයි. මේකේ තිබෙන ටිකම සිද්ධ වෙන්නේ මෙහෙමයි කියලා පෙළ ගස්සලා තිබෙනවා. එතකොට පහසුයි.

දැන් බලන්න චිත්ත වීථියක භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාරාවජ්ජන - චක්ඛු විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන - ජවන් - තදාරම්මණ - භවාංග යන මේ සිත් පේළිය ඔය විදියට සිද්ධවන ක්‍රියාවලිය ලස්සනට කියලා තිබෙන නිසා අපිට තේරෙනවා. ඔය එක සිතක්වත් දේශනා කරලා නැති අමුතුවෙන් බෑග් එකෙන් අරන් දාපු ඒවා නොවෙයි. ඒවා හොඳට පැහැදිලිව ක්‍රියාත්මක වෙන එකින් එකට එකින් එකට පෙළ ගැස්සිලා ක්‍රියාත්මක වෙන විදිය කියලා තිබෙන එකක් විතරයි. අනන්තර ප්‍රත්‍යය නත්ථි ප්‍රත්‍යයට සම්බන්ධ කරලා තේරුම් ගැනීමට මේ චිත්ත වීථි පිළිබඳව හොඳට දැන හඳුනා ගැනීම හරි ප්‍රයෝජනවත්.

මේ චිත්ත වීථියක් කියලා දෙනකොට අපේ මේ අහගෙන ඉන්න පින්වතුන්ට අපි කිව්වා මුලින්ම ක්‍රියාත්මක සිතක් පහළ වෙනකොට යම්කිසි අරමුණක් අල්ලාගෙන අරමුණකට හැරිලා අරමුණක් දැන ගැනීමට එල්ල වීගෙන යන සිතක් පහළ වෙන්නේ. ඒක එන්නේ භවාංගයෙන් කියලා. භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද කියලා මේ සිත්වල අවස්ථා තුනක් තිබෙනවා මූලික සිතේ, ඊට පස්සේ තමයි ආවජ්ජන සිත පහළ වෙන්නේ. ඊට පස්සේ තමයි චක්ඛු විඤ්ඤාණ සිත පහළ වෙන්නේ කියලා මේ විදියට කියලා තිබෙනවා. මේ සිත් පේළියේ චිත්තක්ෂණ 17 ක් තිබෙනවා, ඒ සිත් පේළියේ අවසාන එක යනවා භවාංගයට. මහන්තාරම්මණ චිත්ත වීථියක නම් භවාංගයට යන්නේ ඊට කලියෙන් තදාරම්මණ ගතියක් තිබෙන සිතක් තිබ්ච්ච නිසා. එතකොට ඒ තදාරම්මණ සිත තමයි අවසාන භවාංගයට අනන්තර ප්‍රත්‍යය දී තිබෙන්නේ. ඒ තදාරම්මණයට අනන්තර ප්‍රත්‍යය ශක්තිය දුන්නේ ඊට කලින් තිබුණ තදාරම්මණ සිත. ඒ තදාරම්මණ සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය උනේ සත්වෙනි ජවනය. සත්වෙනි ජවනය එන්නේ නෑ හයවෙනි ජවනය නැත්නම්. ජයවෙනි ජවනයක් තිබිලා තිබෙනවා. හයවෙනි ජවනය ඇතිවෙන්නේ නෑ පස්වෙනි ජවනය නැත්නම්. පස්වෙනි ජවනයේ තිබෙන අනන්තර ප්‍රත්‍යයෙන් තමයි හයවෙනි ජවනය ඇති උනේ. පස් වෙනි එක ඇතිවෙන්නේ හතරවෙනි ජවනයේ අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන්. හතර වෙනි එක ඇතිවෙන්නේ තුන්වෙනි ජවන් සිතේ අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන්. තුන්වෙනි එක ඇතිවෙන්නේ දෙවෙනි ජවන් සිතේ අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන්. දෙවෙනි එක ඇතිවෙන්නේ පළවෙනි ජවන් සිතේ අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන්. මේ පළවෙනි ජවනයේ පහළ වීමට අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබාදෙන්නේ වොත්ථපන කියන්නා වූ සිතයි. ඒ සිත පහළ වෙන්නේ සන්තීරණ සිත නිසයි. සන්තීරණය පහළ වෙන්නේ සම්පටිච්ඡන සිත නිසයි. එතකොට මේ හැම එකේම තිබෙනවා ඊළඟ එකට ගැලපෙන්න පය තබන්න - ගැලපෙන්න පහළ වෙන්න අමුතු ගතියක් දීපු බවක්. ඒ හැම එකේම පෙර පෙර සිත අනන්තර ශක්තිය ගොනුකරලා තිබෙනවා. මේ කියන්නාවූ පේළිය පිටි පස්සට යනවා - චක්ඛු විඤ්ඤාණය - ආවර්ජන සිත - භවාංග උපච්ඡේදය - භවාංග චලනය - භවාංගය. මේ ජීවිතියේ භවාංගයක් හැදෙන්නේ ප්‍රතිසන්ධිය නිසයි. ප්‍රතිසන්ධියක් හැදෙන්නේ පෙර ජීවිතියේ චුතියක් නිසයි. මේක මේ විදියට පේළියට පිටි පස්සට පිටි පස්සට යනවා.

අපි මෙහෙම හිතුවොත්; සිත් දාහක් එක වැලකට දාලා පේළියට තිබ්බොත් ඒ සිත් දාහම කරන්නේ එකම වැඩක් නොවෙයි. ඒ පේළියේ තිබෙන සිත් දාහට එක එක තැන් වල තිබෙන්නේ වෙන වෙනම වැඩ. ඒ වෙන වෙන වැඩ කරන්න උදව් උපකාර කරන චෛතසිකත් ඒ ඒ සිත් වලට ලැබෙන්නේ අඩුවෙන් හෝ වැඩියෙන් එක එක මට්ටමට, එක එක ප්‍රමාණ වලට. සමහර සිතක් බැලීම කරනවා සමහර සිතක් ඇසීම කරනවා. ඒ සිත් දාහටම හම්බවෙන අරමුණුත් එකම වෙන්නේ නෑ. ක්‍රියාත්මක වීම වශයෙන් වෙනස්, බැලීම් දැකීම් වශයෙන් වෙනස්, ඒ සිත්වල බලය වශයෙන් වෙනස්. හැම එකේම වෙනස් ගති තිබෙනවා. නමුත් ඒ සිත් දාහම එක පේළියකට ඉන්නවා වෙන්න පුළුවන්. නමුත් ඒ සිත් දාහෙන් කෙරෙන වැඩ කටයුතු වෙනස්. ඒ වැඩ කටයුතු වෙනස් උනාට මුලින් කරපු වැඩේට ඉදිරිපත්

වෙච්ච සිතයි චෛතසික ටිකයි නැති වෙලා යනකොටම ඊළඟට 'ඔයාට ඔන්න මේ වැඩේ බාරයි' කියන්න වගේ අමුතු තල්ලුවක් දීගෙන තමයි යන්නේ.

දැන් චුති සිත බලන්න. චුති සිත කියන එක නැතිවෙන කොටම 'මම මෙහෙන් චුත කරනවා, ඔන්න ප්‍රතිසන්ධියක් තිබෙනවානම් අවස්ථාව' කියලා කියන්න වගේ තමයි පෘථජ්ජනයෙකුගේ සහ රහත් වෙච්ච නැති ආර්යන් වහන්සේ නමකගේ සිතක චුතිය සිද්ධ වෙන්නේ. ප්‍රතිසන්ධියකට ground එක හදලා තියලා තමයි ඒ අවස්ථාවේ චුතිය සිද්ධ වෙන්නේ. ඉතින් මෙන්න මේ ධර්ම ස්වභාවයෝ ටික ඕකේ තිබෙනවා. ඉතින් අර අනන්තර ප්‍රත්‍යය සහ නත්ථි ප්‍රත්‍යය යන දෙකේ තිබෙන වෙනස ඔන්න ඔය විදියට සූක්ෂමව සියුම්ව තිබෙන බව අපි තේරුම් ගන්න ඕනෑ.

මේ පින්වතුන්ට මතක ඇති අපි මේ කථාව ඉස්සර කියන වෙලාවේදී අවස්ථා දෙකක් විශේෂයෙන් සැලකුවා කියලා. ඒක දැන් කිව්වේ නැත්නම් මතක් කරලා දුන්නේ නැත්නම් හොඳ නෑ. මේ පින්වතුන්ට ගැටලුවක් වෙන්න පුළුවන්.

එකක් තමයි අපි තේරුම් ගන්න ඕනෑ 'කාලය' කියන්නේ මොකක්ද කියලා. දැන් අපිට ප්‍රශ්නයක් උනහම අපි කියනවා 'කාලයෙන් ඕක විසඳෙයි' කියලා. ඇත්තටම 'කාලය' කියලා ප්‍රශ්න විසඳන්න එහෙම ධර්ම ස්වභාවයක් නෑ. 'කාලය' කියලා අපි කිව්වට එහෙම ධර්මයක් නෑ. 'කාලය' කියලා කියන එක නිකම් නැති දෙයක් ඇතෙයි කියලා හිතාගෙන ඉඳීමක් තිබෙන්නේ. පරමාර්ථ ධර්ම වශයෙන් බැලුවට පස්සේ 'කාලය' කියලා මොකක්වත්ම නෑ. නැති දෙයක් ඇතෙයි කියලා හිතාගෙන තිබෙනවා, හිතාගෙන අපි ඒ ගැන කථා කරනවා. හැබැයි නැති දෙයක් ඇතෙයි කියලා හිතාගෙන අපි ඒ 'කාලය' කියන වචනය පාවිච්චි කරන්නේ සමාන්‍යයෙන් 'ඇතෙයි' කියන දේවල් වල තිබෙන ක්‍රියාකාරී ස්වභාවයෝ ටික තේරුම් ගැනීමටයි. එහෙම නැතුව කාලයක් කියලා දෙයක් ඇත්තටම නෑ. මේක කියන්න හේතුව දැන් අපි මෙච්චර වෙලා කියාගෙන ගියා පරණ කථා කරපු අනන්තර ප්‍රත්‍යයේ සහ නත්ථි ප්‍රත්‍යයේ තිබෙන වෙනස. එතකොට සිතක් ඇතිවෙලා නැතිවෙන කොටම ඊට පස්සේ එතැනට පැන ගන්න ඉඩ හදලා දෙන එක අනන්තර ප්‍රත්‍යය කියලා කිව්වා. එතකොට ඒ පළමුවෙන් ඇතිවෙලා නැති වෙච්ච සිතයි දෙවෙනුව ඇති වෙච්ච සිතයි දෙකේ අතර gap එකක් තියන්නේ නෑ. ගෑව්ලා වගේ තමයි එන්නේ. එතකොට අතරක් නෑ, අනන්තර ගතිය තිබෙනවා. හැබැයි පළවෙනි සිත පහළ වෙලා දෙවෙනි සිත පහළ වෙනකොට කාලයේ gap එකක් නෑ. හිස් බවක් නෑ. නමුත් සමහර තැන් වල ටිකක් හිස් තිබෙන තැන් තිබෙනවා. එහෙම හිස් තිබෙන තැන් දෙකක් තිබෙනවා. ඒ තැන් දෙකෙන් එකක් තමයි පෘථජ්ජන භාවයේ ඉන්න එක්කෙනුකුට සිදු වෙන දෙයක් බොහෝ සෙයින්. අනිත් එක ආර්යන් වහන්සේ කෙනෙකුට සිද්ධ වෙන දෙයක්. පෘථජ්ජන භාවයේ ඉන්න එක්කෙනෙකුට සිද්ධ වෙන්නේ මෙහෙමයි - ඒ තමයි යම්කිසි කෙනෙක් හොඳට භාවනා කරලා භාවනා කරලා එයා නාම ධර්ම එපා කරලා සිත නැතිවේවා කියලා පැතීම් වශයෙන් භාවනාවක් කරලා පංචම ධ්‍යාන ශක්තිය උපදවාගෙන රූපාවචර බ්‍රහ්මලෝකයක් තිබෙනවා අසංඥ තලය කියලා, ඒකෙ උපදිනවා. අසංඥ තලයේ උපදිනකොට ඒකෙ ප්‍රතිසන්ධි සිත් පහළ වෙන්නේ නෑ. සිතක් නැති ඇඟක් විතරක් පහළ වෙනවා. අපි උදාහරණයක් හැටියට ගත්තොත් මෙහෙමයි. ඒක මහා එපාකරපු අමුතුම ජීවිතයක්. බ්‍රහ්ම ජීවිතයක් තමයි. ඒක හතරවෙනි ධ්‍යානයට සමාන එකක් නමුත් බුදුරජාණන්වහන්සේත් ඒ භවය හොඳ තැනක් හැටියට වර්ණනා කරලා නෑ. ඒක අභව්‍ය තැනක් හැටියට තමයි කියලා තිබෙන්නේ. ඒ අභව්‍ය තැන නිර්වාණ ධාතුව අවබෝධ කරගැනීමට යන ගමන් මග හදා ගැනීම් වශයෙන් අභව්‍ය උනාට ඒක කරන අයට ඒක භව්‍යයයි. ඒ අයට ඒක හොඳ හින්දයි එතැනට යන්නේ.

අපි හිතමු මනුස්සයෙක් සසර කලකිරිලා, සිත ගැන කලකිරිලා නිවන් දැකීමට හිතන්නේ නැතුව එයා හිමාලයේ පැත්තට ගිහිල්ලා 'හිත නැතිවේවා' කියලා භාවනාවක් කරනවා. එයා මනුස්ස ඇඟ සහ මනුස්ස හිත කියන දෙකෙන් තමයි මේ මනුස්ස ලෝකයේ ඉන්නේ. මෙයා මේ විදියට ඉඳලා භාවනා

කරලා භාවනා කරලා දැන් අර අසංඥ තලයට යන්න පුළුවන් විදියට ධ්‍යාන හදාගෙන හිත දැන් හොඳට ගොනුකරගෙන ඉන්නේ. දැන් මෙයා මේ මනුස්ස ලෝකයේ ඉපදුනේ පිනකින්. අපි හිතමු මෙයා මීට ඉස්සරවෙලා අනුරාධපුරයේ මල් පූජා කරපු මනුස්සයෙක් කියලා. ඒ මල් පූජා කරපු පිනෙන් තමයි මේ මනුස්ස ජීවිතියේ ප්‍රතිසන්ධිය ගන්නේ. එතකොට එයාට මේ ප්‍රතිසන්ධිය ගන්න ආරම්මණය උනේ අර මල් පූජා කිරීම. එතකොට මල් පූජා කිරීමක් පදනම් කරගෙන ජනිත වෙච්ච කුසල කර්මයකින් ගත්ත ප්‍රතිසන්ධි සිතකින් තමයි මේ මනුස්ස ජීවිතිය ආරම්භ වෙන්නේ. එතකොට ඒ සිත තමයි එයාට භවාංගය වෙන්නෙත්. දැන් මේ මල් පූජා කරපු මනුස්සයෙක් තමයි මේ මනුස්සලෝකයේ ඉන්නේ. එතකොට ඒ මනුස්සයා තමයි දැන් හිමාලයට ගිහිල්ලා ඔය භාවනාව කරන්නේ කියලා උපකල්පනය කරනවා. දැන් මෙයා භාවනා කරලා භාවනා කරලා වයසට ගිහිල්ලා චුත වෙන්න යනවා. දැන් බලන්න මේ මනුස්සයා මනුස්ස ලෝකයට ප්‍රතිසන්ධි වශයෙන් එනකොට මෙයාට හම්බවෙනවා ප්‍රතිසන්ධි සිතයි ඒ ප්‍රතිසන්ධියත් එක්ක ඇඟකට අවශ්‍ය රූප ටිකකුයි. මෙයාට ප්‍රතිසන්ධි සිතටයි රූපයටයි දෙකටම අවශ්‍ය පුංචි මූලික ධර්ම දෙකක් මනුස්සලෝකයේ ඉස්සෙල්ලාම පහළ වෙනවා. එතකොට ඊට කලින් එයාට එහෙන් චුත සිතක් පහළ උනා. දැන් මෙයා උපදිනකොට මෙයාට ඇඟයි සිතයි දෙකම හම්බඋනා. දැන් මෙයා මෙහෙන් භාවනා කරලා මෙතැනින් අයින් වෙලා යනකොට චුතිය හැදෙනවා, චුතියෙන් පස්සේ එයාට අසංඥ තලයේ ඇඟක් පහළ වෙනවා එයාවත් දන්නේ නැති. උපන්කෙනා දන්නේ නෑ එයාගේ ඇඟ මොකක්ද කියලා. එහෙම එකක් තිබෙනවා. හේතුව, එයාට හිතක් පහළ වෙන්නේ නෑ. සිත් පරම්පරාව මේ ජීවිතියේ චුතියෙන් එයාගේ සිත තාවකාලිකව නැති උනා. ඇඟ continue උනා. එහා පැත්තේ තිබෙන්නේ හිතක් නැති ඇඟක්. ඒ ඇඟ ඒ විදියටම තිබිලා නැතිවෙනවා. ඒකට කියනවා ඒ බ්‍රහ්මයා කල්ප 500 කින් චුතඋනා කියලා. ඒක නැති උනහම නැවත හිතක් කොහේ හරි තැනක ප්‍රතිසන්ධි ගන්නවා. දැන් බලන්න මේ ජීවිතයේ චුතියයි ඊළඟ ජීවිතියේ නොවෙයි තුන්වෙනි ජීවිතියේ ප්‍රතිසන්ධියත් අතර කාලය කල්ප 500යි.

දැන් හිතලා බලන්න මෙයාගේ චුතියයි ප්‍රතිසන්ධියයි අතර කාලය කල්ප 500යි. හැබැයි කාලය වශයෙන් අපි හිතන කල්ප වශයෙන් 500 යක් ගතවෙලා තිබුණත් ඒ මනුස්සයා මෙතැනින් චුත වෙනකොට තිබුණ චුති සිත තමයි තුන්වෙනි ජීවිතියේ ප්‍රතිසන්ධියට අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබා දෙන්නේ. මෙයා කල්ප 500 rest එකේ ඉඳලා නැතිවෙනකොටම ප්‍රතිසන්ධි සිත පහළ වෙනවා. නමුත් ශරීරය අයිති කාරයා දන්නේ නෑ මේ මගේ ශරීරය කියලා. මට මතක් උනා කථාවක්. සමහර අය දන්නේ නෑ තමන්ට සිද්ධවෙන දේ. මම පොඩි දරුවෙකුගෙන් ළඟදී ඇහුවා 'ඔයා කෑම කෑවද' කියලා. 'කෑවා' කියලා කිව්වා. මම ඇහුවා 'ඔයා මොනවාද කෑවේ' කියලා. ඊට පස්සේ කිව්වා 'ඒකනම් දන්නේ නෑ, අම්මගෙන් ගිහිල්ලා අහන්න ඕනෑ' කියලා. ඉතින් බලන්න ඒ දරුවාගෙන් කෑම කෑවද කියලා ඇහුවහම කෑවා කිව්වා, මොනවාද කෑවේ ඇහුවහම ඒක දන්නේ නෑ කිව්වා. අම්මගෙන් ගිහිල්ලා අහන්න ඕනෑ කියලා කිව්වා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ, ඒ ළමයා දන්නේ නෑ කටට දාන්නේ මොකක්ද කියලා. අම්මා ගුලි කර කර ගුලි කර කර දෙනවා, එයා හපලා ගිලිනවා. එයා දන්නේ නෑ මොනවා කනවද කියලා. හැබැයි මොනවා හරි කනවා. ඔය අසංඥ තලයෙත් උප්පතියත් හැටියට මොනවාහරි උපදිනවා. උපන්නා වූ කෙනා දන්නේ නෑ, එයා ඉන්නේ කොහෙද කියලා. නමුත් ඒ චුතියයි ප්‍රතිසන්ධියයි අතර කාලය කල්ප 500 උනාට අනන්තර ප්‍රත්‍යය ලබාදෙනවා. ඕන්න පෘථජ්ජනයාගේ තිබෙන්නා වූ ස්වභාවය.

අනිත් එක තමයි අෂ්ඨ සමාපත්තිලාභී ස්වාමීන්වහන්සේලාට තිබෙනවා සිත නවත්වලා ඉන්න පුළුවන් තැනක්. ඒකට කියනවා නිරෝධ සමාපත්ති ගතවෙනවා කියලා. නිරෝධ සමාපත්තියකට සමවදින්නා වූ ස්වාමීන්වහන්සේලා ඉන්නේ දෙදෙනයි. එක්කෝ රහතන් වහන්සේ නමක් වෙන්න ඕනෑ, නැත්නම් අෂ්ඨ සමාපත්තිලාභී අනාගාමීන් වහන්සේ නමක් වෙන්න ඕනෑ. ඉතින් ඒ අනාගමීන් වහන්සේ හරි රහතන්වහන්සේ හරි නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් අයින් උනාට පස්සේ උන්වහන්සේගේ සිත නිරෝධ ගතවෙනවා. ඒ කියන්නේ ක්‍රියාත්මක වෙන්නේ නෑ. ඊට පස්සේ පැයක් හරි දෙකක් හරි දවසක්

හරි කොච්චර හරි කාලයක් ඉඳලා නැවත හිත එනවා. එතකොටත් තිබෙනවා කාලයක්. ආන්න ඒ කාලයෙන් පස්සේ පළවෙනි නේවසඤ්ඤානාසඤ්ඤායතනය සමාපත්ති සිත තමයි ඊළඟට පහළ වෙනන්නා වූ සිතට අනන්තර ප්‍රත්‍යය ශක්තිය දෙන්නේ. ඔන්න ඔය අවස්ථා දෙක තමයි ආර්යන් වහන්සේගේ සහ පෘථජ්ජන පුද්ගලයෙකු අතර කාල වශයෙන් දීර්ඝව තිබෙන්නා වූ අවස්ථා දෙක.

ඉතින් මේ සිත් ගැන කියාගෙන යනකොට මේ සිත්වල තිබෙනවා අමුතුම විදියේ ගනුදෙනු කරන හැකියාවල්. මේ සිත මේ විදියට අධ්‍යානය කිරීම දැන ගැනීම තේරුම් ගැනීම ඒකාන්තයෙන් අප විසින් කළ යුතුයි. එතකොට තමයි මේ හේතු ඵල ධර්මයන්ගෙන් අයින් වෙලා අපිට යන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා මේ පින්වත් සැම දෙනාටම අපි අද මෙන්න මේ ධර්ම කාරණා දෙකේ තිබෙන්නා වූ වෙනස තමයි කියලා දුන්නේ. අපේ අභිධර්මය ඉගෙන ගන්න පින්වතුන් තව කරුණු ටිකක් දැනගන්න ඕනෑ. ඒ තමයි රූප පිළිබඳව දැන ගන්න ඕනෑ. චිත්තජ රූප කියලා වෙනම කොටසක් තිබෙනවා, ප්‍රතිසන්ධි කර්මජ රූප තිබෙනවා. බාහිර හැදෙන්නා වූ රූප තිබෙනවා. ඒවාට කියනවා බාහිර රූප කියලා. අපේ ශරීරයේ හැදෙන ආහාරජ රූප කියලා වෙනම කොටසක් තිබෙනවා. ඍතුජ රූප වෙනම තිබෙනවා. අසංඥ තලයේ ඉන්න සත්වයන්ගේ පවතින කර්මජ රූප තිබෙනවා. තව ප්‍රවෘති කර්මජ රූප තිබෙනවා. මේ විදියට මේ රූප අවස්ථා හතකට වෙන් කරලා තිබෙනවා. මේ අවස්ථා හත තේරුම් ගැනීම හරි ප්‍රයෝජනවත්. ඒ වගේම චිත්ත වීථි පිළිබඳව නැවත නැවත දැනුවත් වෙන්න ඕනෑ. රූප ගොඩවල් හත පිළිබඳවත් දැනුමක් ඇතිවෙන්න ඕනෑ. ඊළඟට මේ සිත්වල තිබෙන විවිධත්වයත් දැන ගන්න ඕනෑ. මේවත් එක්ක තමයි අපිට මේ අභිධර්මය මේ දක්වා කරගෙන එන්න පුළුවන් උනෙත් තව පිරිසිදුව දැනගන්න පුළුවන් වෙන්නෙත්. ඒක නිසා මම අද මේ පින්වතුන්ට මෙතකින් මේ කියලා දීපු කාරණා ටික අවසන් කරනවා. මේ පින්වතුන් මේකෙන් හොඳ අවබෝධයක් හදාගෙන ඒවාගේම දැනුමක් හදාගෙන ඒවගේම සිතීමක් ආරම්භ කරගෙන චින්තනයක් අවධිකරගෙන ඒවගේම ධර්ම මාර්ගයේ මනසිකාර වශයෙන් ගමන්කොට අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා, සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස මට හිතුනා අහන්න අර අනන්තර ප්‍රත්‍යය එක සිතක හැර හැම සිතකම තියෙනවා. එතකොට ඒක අනිත් හිතට ඇතිවෙන්න ශක්තියක් ලබලා දීලා නැති වෙනවා කිව්වා. එතකොට ඒ සිත ක්ෂණයක් පැවතිලා නැති වෙන්නේ නත්ථි ප්‍රත්‍යය නිසාද කියලා හිතන එක වැරදිද ස්වාමීන් වහන්ස?

<u>පිළිතුර</u> - ඇත්ත වශයෙන්ම හිස්බව නැතිබව පැහැදිලි කිරීම සඳහා කියලා දීපු විස්තර කරලා තිබෙන ප්‍රත්‍යය ධර්මයක් තමයි ඔය නත්ථි ප්‍රත්‍යය කියලා කියන්නේ. ඔය කියපු නිසා මේක කියන්න පුළුවන්. අඹ ගෙඩියක් කෑවහම වතුර පිපාසය නැතිවෙනවා, බඩ ගින්න නැතිවෙනවා. එතකොට ඒ අඹ ගෙඩියේ තිබෙනවා අපේ වතුර පිපාසය නැති කරන බඩ ගින්න නැති කරන යම්කිසි ගතියක්. එතකොට ඒකෙ තිබෙනවා කුස ගින්න නසන පිපාසය නසන ශක්ති විශේෂයක් ගුණ විශේෂයක්. එතකොට එහෙම තිබෙන්නේ අඹ ගෙඩියක් කියලා දෙයක් තිබෙන නිසා. එතකොට අඹ ගෙඩියක් කියලා දෙයක් නැති උනහම නැති දේක ඒවගේ ශක්තියක් හිටින්න විදියක් නෑ. ඒවගේ මේ හිතක් පහළ උනහම ඒ තිබෙන හිතක ශක්තියක් ගැන කීම තමයි අනන්තර ප්‍රත්‍යය වෙන්නේ. එතකොට අනන්තර ප්‍රත්‍යය කියලා කියනකොට ඒකේ දෙවෙනි හිතට අමුතු දෙයක් දෙන්න හරි කියලා කබල් හිතක් හරි තිබෙනවා. එටකොට තිබ්ච්ච එකක ශක්තියක් ඡායාවක් තමයි අර වද්දලා දෙන්නේ. එතකොට නැති දෙයක - ඒ කියන්නේ එතැන හිතකුත් නෑ, තිබ්ච්ච හිතත් ගිහිල්ලා, එකත් නෑ. තිබ්ච්ච හිත නැති උනහම ඒ නැති කමේ මොකක්ද තිබෙන හයිය කියලා හිතෙන්න පුළුවන්.

ඇත්ත වශයෙන්ම අහපු එක හොඳයි, නත්ථි ප්‍රත්‍යය කියන එක නැති බවේ හයියක් තිබෙනවා කියලා කියන්නම නොවෙයි ඕක දක්වලා තිබෙන්නේ. ඒක කියලා තිබෙනවා කියලා කියන්නේ දිගට එක ළඟින් එක ළඟින් පහළවෙවී නැති වෙන පහළ වෙවී නැති වෙන සිත් පෘථජ්ජන අය ධර්මය තේරෙන්නේ නැති අය ඔය කෝටි ගණන් සිත් එක මිටියට අල්ලලා එකට කරලා පැකට් කරලා පේළි ගස්සලා එක ගුලියට ගන්නවලු. ඒක හින්දා දෘෂ්ඨී ගත වෙනවලු. හිත කියන එක මෙච්චර ලොකුයි මෙච්චර මහතයි මෙච්චර හිතකින් මෙච්චර හිතන්න පුළුවන් කියලා ගන්නවලු. ඔය දෘෂ්ඨී ගත වීම නැති කරන්න ඒ දෘෂ්ඨියට අහුවෙන එක වලක්වන්න උපකාරක ධර්මයක් හැටියට තමයි නත්ථි කියන ප්‍රත්‍යය ගතිය දක්වලා තිබෙන්නේ. ඇත්තටම නැති කමේ ශක්තියක් තිබෙනවා කියන එක නොවෙයි නැති කමේ නැති බවේ තිබෙන්නා වූ ස්වභාවය තව එකකට හේතු වෙනවා කියන එක දක්වන්න තමයි නත්ථි කියන ප්‍රත්‍යය දක්වලා තිබෙන්නේ. හැබැයි ඒකෙ ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න ගතිය දක්වන එක නම් අනන්තර ප්‍රත්‍යයට ළංකරලා දේශනා කරලා තිබෙනවා. ඒක නිසා එක තේරුම් ගන්න ඕනෑ ඉස්සෙල්ලා සිත දෙවෙනි සිතට යම්කිසි සමාන ඡායාවක් වද්දාගෙන වගේ ගියත් ඒ ඉස්සරවෙලා දෙවෙනි සිතට ශක්තිය දීලා නැතිවෙලා ගිය ඒ හිස්කම තමයි, එයා නැතිවීම තමයි, ඒ නැතිවීම් මාත්‍රය තමයි දෙවෙනි සිතට එන්න පුළුවන් කම තිබෙන්නේ කියන විදියට තේරුම් ගත්තානම් හොඳයි කියලා අපි කරුණාවෙන් මතක් කරනවා. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස දැන් රහතන්වහන්සේලාගේ චුතිසිත කියන එකෙන් ශක්තියක් දෙන්නේ නෑ කියලා කිව්වා. එතකොට මගේ පළවෙනි ප්‍රශ්නය ඒ ශක්තියට මොකද වෙන්නේ කියන එක. දෙවෙනි ප්‍රශ්නය තමයි ස්වාමීන් වහන්ස අසංඥ තලයේ ප්‍රතිසන්ධිය ගත්තහම ඒ ආයුෂ ප්‍රමාණයම විඳලද එතැනින් අයින් වෙන්නේ කියන එක.

<u>පිළිතුර</u> - පළමුවෙන්ම දෙවෙනි ප්‍රශ්නය අසංඥ තලයේ යම්කිසි කෙනෙක් ඉපදුනොත් එහෙම බ්‍රහ්ම ලෝකවල තිබෙන්නා වූ ස්වභාවය තමයි නියමිත කාලය ඉඳලා තමයි යන්නේ. ඒවාට නිශ්චිත ආයුෂ ප්‍රමාණයක් තිබෙනවා. හේතුව විශේෂයෙන්ම කාම ලෝක වල වෙනස තමයි කාම ධර්මයෝ නිසා සිත කැළඹෙනවා. ඒක නිසා පිනකින් එහෙ ගියා උනත් වැඩේ සවුත්තු කර ගන්නවා සමහර වෙලාවට. සිත තරහ ගස්සාගෙන ඊට පස්සේ කෑම කන්න බැරුව අර කියන්නේ ඛිඩ්ඩාපදොසික කියලා. අය ක්‍රීඩාවට යනවා කන්න බැරි වෙනවා මැරිලා යනවා. සමහර අයට තරහ ගියහම මනස දූෂණය කරගන්නවා එතැනින් චුත වෙනවා. ඒකට කියනවා මනොපදොසික කියලා. හැබැයි ඒවා කාම ලෝකයේ. ඒක නිසා බ්‍රහ්ම ලෝකයේ ඉන්න සත්වයෝ ඒ නිශ්චිත ආයුෂය වින්දනය කරනවා.

අනිත් එක තමයි අර රහතන්වහන්සේගේ සිතේ තිබෙන්නා වූ ඒ ගතිය චුති සිතෙන් පස්සේ ආයේ නැවත හිටින්නේ නෑ. ඒකට කියනවා අනාගත භවයක් කිසිසේත්ම ප්‍රාර්ථනා කරන්නේ නැති හින්දා ආනාගත සිතක් නැවත ඇතිවේවා කියලා කැමැත්තක් ආසාවක් ඡන්දයක් නැති නිසා ඉස්සරහට පවතීවා කියන ඒ ඡන්දය අයින් කරපු නිසා උගුල්ලපු නිසා, ඉවත් කරපු නිසා ඡන්දයක් නැති බැවින් ඕනෑ කමක් නැති බැවින් පැතීමක් නැති බැවින් ඒ ස්වාමීන්වහන්සේලාගේ ඒ ශක්තිය එතැනින්ම අතුරුදහන් වෙලා තුරන් වෙලා නැතිවෙලා යනවා, ඒක කොහේටද ගියේ කියලා කියන්න බැරිවෙන විදියට.

ඒකට උපමාවක් දක්වනවා රත්න සූත්‍රයේ
**'ඛීණං පුරාණං නව නත්ථි සම්භවං** = පරණ දේවල් ටික නැතිවෙලා ගියා නැවත අලුතින් හටගන්නේ නෑ.

**විරත්තචිත්තායතිකෙ භවස්මිං තෙ ඛීණබීජා අවිරූළ්හිඡන්දා, නිබ්බන්ති ධීරා යථායං පදීපො** = නැවත භවයක කැමති සිත නැති කරපු - ඡන්දය උගුල්ලපු - ඒ කැමැත්ත නැති රහතන්වහන්සේගේ ඒ සිත්

එහමම නිව්ලා යනවා - රහතන් වහන්සේත් නැතිවෙනවා - රහතන් වහන්සේ නිවනටත් පත්වෙනවා. කෙනෙක් හිටියාද කියලාවත් හොයාගන්න බැරි තත්වයට පත්වෙනවා.

දැන් මේ අපේ ජීවිතියේ නාම රූප ධර්ම ක්‍රියාත්මක වීම වශයෙන් පත්තු වෙලා තිබෙන්නේ. මේක කොයි වෙලේ හරි නැවතිලා ගියානම් අපිත් එතැන. ඒකනිසා කොහේටවත් යන්නේ නෑ, ඒ ශක්තිය නිව්ලා යනවා. තෙරුවන් සරණයි!

<u>ජයන්ත මහත්මයා</u> - ස්වාමීන් වහන්ස මට තේරුනා ස්වාමීන් වහන්සේ විස්තර කරපු කොටස් ටික. අනන්තර ප්‍රත්‍යයත් ඒවගේම නත්ථි ප්‍රත්‍යය කියන එකේ සම්බන්ධයත් වෙනසත් දෙකම තේරුණා. එතෙන්දි නත්ථි ප්‍රත්‍යයෙන් නාස්ථික ශක්තියක් නැති බවත් ජනක ශක්තියක් පමණක් ඇති බවත් තේරුණා ස්වාමීන් වහන්ස. චුතියෙන් පසුවම ප්‍රතිසන්ධිය කියනකොට පොඩි කාරණයක් අහගන්න හිතුනා ස්වාමීන් වහන්ස. අර ආහාර සූත්‍රයේ වගේ තැන් වලදී 'චත්තාරො මෙ, භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය' කියලා. එතකොට එතැන සම්භවෙසීනං කියනකොට මොනවගේ තත්වයක්ද ස්වාමීන්වහන්ස? තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - සම්භවෙසී කියන වචනය තවත් තවත් තැන් වල කියලා තිබෙනවා. එතැන භූතානං වා කියන්නේ ඉපදුනා වූ සත්වයන්ට. ඉපදෙමින් සිටින සත්වයන්ට තමයි සම්භවෙසී කියලා කියන්නේ. අපි හිතමු මවු කුසේ ඉපදීම සම්පූර්ණ කරපු නැති ඒ කියන්නනේ මවුකුසේ ඉන්න අය ඉන්නවා, බිත්තරේක ඉන්න අය ඉන්නවා. ඒවගේ අයට තමයි සම්භවෙසී කියන වචනය පාවිච්චි කරලා තිබෙන්නේ. ඔය වචනය කරණීය මෙත්ත සූත්‍රයෙත් තිබෙනවා. භූතා වා සම්භවෙසී වා සබ්බෙසත්තා භවන්තු සුඛිතත්තා කියලා. භූතා වා කියලා කියන්නේ ඉපදිලා සම්පූර්ණ වෙච්ච අයට. සම්භවෙසී කියලා කියන්නේ ඉපදීමේ ක්‍රියා වලියේ දිගට අල්ලාගෙන ඉන්න අයට.

සමහර වෙලාවට ඔය වචනය පාවිච්චි කරනවා astral body එකටයි අන්තරා භවය කියන එකටත් ඔය වචනය පාවිච්චි කරන්න උත්සාහ කරනවා, එහෙම එකක් නොවෙයි මේ කියන්නේ.

<u>ජයන්ත මහත්මයා</u> - හොඳමයි ස්වාමීන් වහන්ස අප්‍රමාණ පිං. අද දවසෙත් ඔබ වහන්සේ අප වෙනුවෙන් කාල වේලාව නොබලා මධ්‍යම රාත්‍රියටත් කිට්ටු කාලයක් දක්වාම අපි සමග රැදී ඉඳලා මේ දහම් කරුණු අපිට මතු කරලා දීලා නිවන් මාර්ගය පහදා දීම සඳහා ඔබ වහන්සේ මේ ගන්න උත්සාහය කැප වීම අපි සවනට සිසිලස වෙනුවෙන් ඉතාමතම කෘතවේදීව පුණ්‍යානුමෝදනා කරනවා. ඒවගේම ඔබ වහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන ලෙසට. තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස.

<u>ස්වාමීන් වහන්සේ</u> - හොඳයි පින්වත්නි හැම දෙනාටම තෙරුවන් සරණයි! සැනසිල්ලක් වේවා! අපි ධර්මය සාකාච්ඡා කරමින් ආපු ධර්මමය ගමන් මගේ තවත් අවස්ථාවක් මේ ඉදිරිපත් කරගත්තේ. පින්වත් ජයන්ත රත්නායක මහත්මයා ඒවගේම අපේ දළුවත්ත මහත්මයා අනිකුත් පින්වතුන් එක්කාසු වෙලා මේ වැඩේ දිගට කරගෙන යනවා. සියලු දෙනාම සහ සම්බන්ධ කරගෙන මේ දළුවත්ත මහත්මයා පටන් ගත්ත ලෝකප්‍රසිද්ධ වැඩසටහනක්. ඉතින් මෙයින් උපදවාගත්ත පිනක් කුසලයක් අපි හැම දෙනාටම අයිති වෙලා තිබෙනවා. බුදුරජාණන් වහන්සේ සත්වයෙක් නැති ආත්මයක් ජීවයක් නැති ධර්ම කොට්ඨාසයක් පරමාර්ථ ධර්ම හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කොටස පිළිබඳව අපි මේ සත්ව හැඟීමෙන් මිදීයැම පිණිස ඒ ධර්මයේ වටිනාකම තේරුම් අරගෙන අභිධර්ම සාකච්ඡාව හැටියට මේක කථා කරන්නේ, මෙච්චර කල් අපි සාකච්ඡා කරගෙන ආවේ. ඒ නිසා අද දවසෙත් මේ අනන්තර ප්‍රත්‍යය සහ නත්ථි ප්‍රත්‍යයේ තිබෙන්නා වූ ස්වභාවයෝ තේරුම් ගන්න උත්සාහ ගැනීමෙන් ඒ පිළිබඳ සිත මෙහෙයවීමෙන් උපදවාගත්ත පිනක් කුසලයක් තිබෙනවා. ඒ පිං බලයෙන් සැම දෙනාටම දුකක්

කරදරයක් නැතුව හිංසාවක් පීඩාවක් නැතුව ඒවාගේම චිත්ත මහන්සියක් නැතුව හොඳින් කුසල ධර්මයන් දියුණු කරගෙන යන්න ලැබේවා!

මේ පින පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාටත් පවුලේ සැම දෙනාටමත් පින්වත් ජයන්ත මහත්මයා ඇතුළු සැම දෙනාටමත් අත්පත් වේවා! ප්‍රශ්න ඇසූ පින්වතුන්ටත් මේ පින හේතු වේවා! හැම දෙනාටම මේ උතුම් පිරිසිදු ධර්ම මාර්ගයේ ගමන්කොට කෙළවර බුද්ධාදී උත්තමයන් වහන්සේලා අවබෝධ කරගත්ත සදාකාලික සැප ඇති අමාමහ නිර්වාණ ධාතුවෙන් සැනසෙන්න ලැබේවා! නිර්වාණ අවබෝධය පිණිස මේ කුසලය මේ පින හේතු වාසනා වේවා! කියලා මෛත්‍රීයෙන් පිං දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.